1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

ISO/IEC 17021 QMS-001-01

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/13/CIR.COM.(3) | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2026.03. 20 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/1/1/01 හා 2026.03.09 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින්, පහත සටහනේ දක්වා ඇති චක්‍රලේඛය, නිකුත් කළ දින සිට දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2026.03.19 දාතමින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2026 | 2026.03.17 | මැද පෙරදිග කලාපයේ නිර්මාණය වී ඇතියුධ ගැටුම් හේතුවෙන්ඉදිරියේදී මතුවිය හැකි ඉන්ධන සපයා ගැනීමේ ගැටලුව සැලකිල්ලට ගෙන එයට මුහුණ දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම |

03. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

රනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

(147)

"ජනතා හිතවාදී හා ඵලදායී රාජ්‍ය සේවයක් උදෙසා"

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
## ஆளுநர் செயலகம் - தென் மாகாணம்
## Governor's Secretariat - Southern Province

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number: GS/SP/ 1/1/01 | ඔබේ අංකය / உமது இல. / Your Number: | දිනය / திகதி / Date: 2026.03. 19 |

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව චක්‍රලේඛ දකුණු පළාත් සභාව සඳහා අදාළ කර ගැනීම.</u>

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක: CSS/7/03/13/CIR.COM(3) හා 2026.03.17 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව,පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව පරිපාලන හා ආයතනික කටයුතු සම්බන්ධයෙන් මැද පෙරදිග කලාපයේ නිර්මාණය වී ඇති යුධ ගැටුම් හේතුවෙන් ඉදිරියේදී මතු විය හැකි ඉන්ධන සැපයා ගැනීමේ ගැටළුව සැළකිල්ලට ගෙන එයට මුහුණ දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සම්බන්ධයෙන් 2026.03.17 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **09/2026** හි ඇතුලත් විධිවිධාන සමගින්, චක්‍ර ලේඛය නිකුත් කර දින සිට දකුණු පළාත් සභාව සඳහා අදාළ කර ගැනීමට 2026.03.19 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා එවමි.

03. ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද ඉහත සඳහන් චක්‍රලේඛ පිටපතක් මේ සමග අමුණා ඔබ වෙත කාරුණිකව යොමු කරමි.

කේ.පී.එස්. දමයන්ති
පරිපාලන නිලධාරී,
ආණ්ඩුකාර ලේකම් වෙනුවට,
දකුණු පළාත.

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 09/2026

මගේ අංකය : EST-6/03/LEA/1060(i)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2026.03.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**මැද පෙරදිග කලාපයේ නිර්මාණය වී ඇති යුධ ගැටුම් හේතුවෙන් ඉදිරියේ දී මතුවිය හැකි ඉන්ධන සපයා ගැනීමේ ගැටලුව සැලකිල්ලට ගෙන එයට මුහුණ දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම**

රජයේ කාර්යාල සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමේ දී නිලධරයන්ගේ ප්‍රවාහන කටයුතු සඳහා මෙන්ම කාර්යාල විවෘතව පවත්වාගෙන යාම සඳහා සැලකිය යුතු තරම් ඉන්ධන ප්‍රමාණයක් භාවිත කෙරේ. ඒ අනුව, මැද පෙරදිග කලාපයේ නිර්මාණය වී ඇති යුධ ගැටුම් හේතුවෙන් ඉදිරියේ දී ඉන්ධන සපයා ගැනීමේ අවිනිශ්චිත තත්ත්වයක් ඇතිවුවහොත් එයට මුහුණ දීම සඳහා දැනට පවතින ඉන්ධන සංචිත අරපිරිමැස්මෙන් යුතුව භාවිත කළ යුතු අතර, එම තත්ත්වය සැලකිල්ලට ගෙන අත්‍යවශ්‍ය සේවාවලට වඩා වැඩි ඉඩක් ලබාදීම වෙනුවෙන් රජයේ කාර්යාල පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කිරීමට 2026.03.16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. නැවත දැනුම් දෙන තුරු සෑම සතියක ම බදාදා දිනය රජයේ කාර්යාල කටයුතු සඳහා නිවාඩු දිනයක් ලෙස සැලකිය යුතු ය. ඒ අනුව, බදාදා දිනය තුළ මේ වන විට ක්‍රියාත්මක වන රාජකාරි එම සතියේ අඟහරුවාදා දිනට යොදා ගත යුතු ය. එසේ වුව ද, යම් නිලධරයෙකු එදිනට සේවයේ යෙදවිය යුතු යැයි ආයතන ප්‍රධානියා විසින් තීරණය කරනු ලබන්නේ නම් අදාළ නිලධරයන් සේවයට කැඳවීමට මෙය බාධාවක් නොවිය යුතු අතර, ඒ සඳහා නිවාඩු දින වැටුප්, අතිකාල හෝ හිලව් නිවාඩු ලබා නොදිය යුතු ය.

03. නිලධරයෙකු සේවා ස්ථානයට නොකැඳවා ඔහුට පැවරී ඇති රාජකාරි ඉටුකරවා ගැනීමට අවශ්‍ය ආයතනික තාක්ෂණික පහසුකම් දැනටමත් පවතින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ට/ රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්ට එම නිලධරයාගේ සේවය ඔහු/ ඇය සේවා ස්ථානයට නොකැඳවා ලබාගැනීමට හැකි වැඩපිළිවෙලක් සකසා ගත හැකි ය.

04. එසේම, බදාදා දිනයේ වසා තබන කාර්යාලවල නිලධරයන් එම සතියේ සෙනසුරාදා, ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක දී අතිකාල ගෙවීමේ පදනමින්, නිවාඩු දින වැටුප් ගෙවීමේ පදනමින් හෝ හිලව් නිවාඩු ලබාදීමේ පදනමින් හෝ සේවයේ නොයෙදවිය යුතු ය.

05. එසේ වුව ද, සේවයේ හදිසි අවශ්‍යතාවක් මත සෙනසුරාදා, ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක දී හෝ ස්වකීය ආයතනයේ නිලධරයන් සේවයට කැඳවීමේ අවශ්‍යතාවක් ඇතිවුවහොත් අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ/ පළාත් ප්‍රධාන ලේකම්ගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ රාජ්‍ය සංස්ථා හා

ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්ගේ අනුමතිය ඇතිව අදාළ ආයතන ප්‍රධානියාට එම නිලධරයන් සේවයට කැඳවීමට බාධාවක් නොමැත. එසේ සේවයට කැඳවනු ලබන නිලධරයන් සඳහා අතිකාල දීමනා , නිවාඩු දින වැටුප් හෝ හිලව් නිවාඩු ලබා දීමට බාධාවක් නොමැත. තව ද, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇතිවූ ආපදා වලට අදාළ රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය නිලධරයන් කැඳවීමේ බලය අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පැවරේ.

06. අධිකරණ ක්ෂේත්‍රයට අයත් ආයතන වෙත නිලධරයන් සේවයට කැඳවීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ඇත.

07. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින පාසල් ඇතුළු අධ්‍යාපන ආයතන, මෙම කාල සීමාව තුළ පවත්වා ගෙන යාම පිළිබඳව අවශ්‍ය උපදෙස් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දෙනු ඇත.

08. රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළව මෙම චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී යම් ගැටලුවක් මතුවුවහොත්, ඒ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විමසා එකී උපදෙස් පරිදි කටයුතු කළ යුතු ය.

09. තවද, රජයේ ආයතනවල උත්සව සම්මන්ත්‍රණ වැනි දේ සංවිධානය කිරීම නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය. මෙහි දී රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා විදුලිය හා ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිත කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ 2022.03.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2022 කෙරෙහි ද අවධානය යොමු කර කටයුතු කරන මෙන් වැඩිදුරටත් අවධාරණය කරමි.

10. තව ද, රජයේ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යාමට මෙයින් බාධාවක් නොවිය යුතු අතර, එම අත්‍යවශ්‍ය සේවා සපයන ආයතන සඳහා මෙන් ම අමාත්‍යාංශ ලේකම්වරයෙකු/ පළාත් ප්‍රධාන ලේකම්වරයෙකු/ රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානියෙකු විසින් බදාදා දිනයේ දී විවෘතව තැබිය යුතු බවට තීරණය කරනු ලබන ආයතන සඳහා ද මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ කර නොගත යුතු ය. එම ආයතන මෙම දිනය සාමාන්‍ය රාජකාරි දිනයක් සේ සලකා කටයුතු කළ යුතු ය. එමෙන්ම මේ වන විට සේවා මුර ක්‍රමය යටතේ නිලධරයන් සේවයේ යොදවනු ලැබූ රාජ්‍ය ආයතන සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ කර නොගත යුතු ය.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2699399
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ad-6-est@pubad.gov.lk

මෙම රාජ්‍ය පරිපාලන
රාජ්‍ය 29/2024 චක්‍රලේඛය/
උපදෙස් ලිපිය ..........දින සිට දකුණු
පළාත්සභාවට අදාල කර ගැනීම
සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ
අනුමැතිය 2024/3/19 දින ලබා දී ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාර ලේකම්/සහකාර ලේකම්/පරි.නි.

කේ.පී.එස්.දමයන්ති
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත